## රක්ෂණ බ්‍රෝකර් හෙවත් තැරැව්කරු

තැරැව් ගාස්තුවක් හෝ කොමිස් මුදලක් අපේක්ෂාවෙන් රක්ෂණ ඔප්පුවක් බලාපොරොත්තු වන අයෙකු රක්ෂණය කිරීම සඳහා අතරමැදියෙකු වශයෙන් කටයුතු කරනු ලබන සමාගමක් අදහස් වේ. රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය කරගෙන යාම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි විය යුතුය.

## ශ්‍රී ලංකාවේ දැනට ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්

1. සී/ස ඒ.බී.සී රක්ෂණ සමාගම
2. සී/ස ඇලියොන්ස් රක්ෂණ ලංකා සමාගම
3. සී/ස ඇලියොන්ස් ජීවිත රක්ෂණ ලංකා සමාගම
4. අමානා තකාෆුල් පී.එල්.සී
5. සී/ස ඒෂියන් එලායන්ස් පී.එල්.සී
6. සෙලින්කෝ රක්ෂණ පී.එල්.සී
7. සී/ස සෙලින්කෝ තකාෆුල් සමාගම
8. සී/ස සමුපකාර රක්ෂණ සමාගම
9. ඊගල් රක්ෂණ පී.එල්.සී
10. සී/ස හේලීස් ඒ.අයි.ජී රක්ෂණ සමාගම
11. සී/ස එච්.එන්.බී ඇෂුවරන්ස් පී.එල්.සී
12. සී/ස ජනශක්ති රක්ෂණ පී.එල්.සී
13. සී/ස ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලංකා සමාගම
14. සී/ස සණස රක්ෂණ සමාගම
15. සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
16. යුනියන් ඇෂුවරන්ස් පී.එල්.සී

## රක්ෂණ කටයුතු හා සම්බන්ධ ආයතනයන්

### ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
11, වන මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
එච්ලන් චතුරස්‍රය, කොළඹ 01.
දුරකථන:011 2396184-9,ෆැක්ස්: 011 2396190
ඊ මේල් ලිපිනය – info@ibsl.gov.lk
වෙබ් අඩවිය – www.ibsl.gov.lk

### ශ්‍රී ලංකා රක්ෂණ සංගමය
සභාපතිගේ කාර්යාලය
සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පී. එල්. සී
4 වන මහල, සෙලින්කෝ හවුස්,
අංක 69, ජනාධිපති මාවත, කොළඹ 01.
දුරකථන : 011 2485706 ෆැක්ස්: 011 2485769

### ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය
සභාපතිගේ කාර්යාලය
ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 101, විනයාලංකාර මාවත, කොළඹ 10.
දුරකථන : 011 2682183 ෆැක්ස්: 011 2683034

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය
1 වන මහල, වයි. එම්. සී. ඒ. ගොඩනැගිල්ල,
143, ශාන්ත මයිකල් මාවත, කොළඹ 03.
දුරකථන : 011 2432050, 011 2431426
ෆැක්ස්: 011 5337731
ඊ මේල් ලිපිනය – slii@sltnet.lk

### රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා
143 A, වජිර පාර, කොළඹ 05.
දුරකථන : 011 4528671-2 ෆැක්ස්: 011 4528670
ඊ මේල් ලිපිනය – info@insuranceombudsman.lk
වෙබ් අඩවිය – www.insuranceombudsman.lk

### මූල්‍ය සේවා අධ්‍යයන ආයතනය
29 වන මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
එච්ලන් චතුරශ්‍රය, කොළඹ 01.
දුරකථන : 011 2423261
ඊ මේල් ලිපිනය – thushara@sec.gov.lk
වෙබ් අඩවිය – www.fsalanka.edu.lk

# ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය




IBSL
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

## ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වර්ෂ 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට අනුව පිහිටුවන ලද රාජ්‍ය ආයතනයකි. ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය, රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂා වන වෘත්තිමය ආකාරයෙන් කරගෙන යනු ලබන බවට වගබලා ගැනීම මණ්ඩලයේ අරමුණ හා වගකීම වන්නේ ය.

## කාර්යයන්

රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීමේ, අධීක්ෂණය කිරීමේ හා විධිමත් කිරීමේ කාර්යය සඳහා පිහිටුවා ඇත.

## රක්ෂණය යනු කුමක්ද ?

රක්ෂිතයා විසින් ගෙවනු ලබන වාරික සැලකිල්ලට ගනිමින් රක්ෂිත උපද්‍රවයන් හේතුවෙන් රක්ෂිතයා විඳින අලාභයන් පියවීමට රක්ෂිතයා හා රක්ෂණ සමාගම අතර ඇතිකර ගත් ගිවිසුමකි. මෙය අවිනිශ්චිත ආකාරයට ඇතැම් අලාභහානි වලට ගොදුරු වන අයට යම් මූල්‍යමය සහනයක් ලබාදෙන ක්‍රමයකි.

රක්ෂණයේ පරමාර්ථය වනුයේ හානි පූර්ණය කිරීමයි.

## රක්ෂණ ඔප්පුවක් ලබාගැනීමේදී දැනගත යුතු කරුණු

- රක්ෂණ ඔප්පුවක් රක්ෂණ සමාගමක් මගින් හෝ රක්ෂණ තැරැව්කාර (බ්‍රෝකර්) සමාගමක් මගින් සෘජුවම ලබාගත හැක.
- රක්ෂණ ඔප්පුවක් ලබාගන්නේ රක්ෂණ නියෝජිතයෙකු මාර්ගයෙන් නම් ඔබට විශ්වාසවන්ත රක්ෂණ නියෝජිතයෙකු තෝරා ගන්න.
- රක්ෂණ සමාගමෙන් ඔබට ලැබෙන යෝජනා පත්‍රයේ අසා ඇති සියලුම ප්‍රශ්න වලට නිවැරදි තොරතුරු එළිකරන්න.
- රක්ෂණ ඔප්පුවේ අඩංගු සියළු කරුණු හොඳින් කියවා තේරුම් ගන්න. මෙය රක්ෂණ හිමිකමක් ලබාගැනීමේදී වැදගත් වේ.

රක්ෂණ ගිවිසුමක් පහත සඳහන් ආකාරයට නිර්මාණය වේ.

**රක්ෂණ ගිවිසුම**

- රක්ෂිත විසින් යෝජනාවක් ඉදිරිපත් කිරීම
- රක්ෂණ සමාගම එය පිළිගැනීම
- රක්ෂණ ගිවිසුමට එළඹීමට දෙපාර්ශවයටම හැකියාව තිබීම.
- ප්‍රතිශ්ඨාවක් තිබීම උදා:- වාරික ගෙවීම
- අරමුණ නීත්‍යානුකූල වීම.

## රක්ෂණ නියෝජිතයෙකු විය හැක්කේ කෙසේද ?

රක්ෂණකරුවකු හෝ රක්ෂණ තැරැව්කරුවකු සමග රක්ෂණ නියෝජිතයෙකු වශයෙන් ලියා-පදිංචි කර ඇති හා කොමිස් මුදලක් සැලකිල්ලට ගෙන ඒ රක්ෂණකරු හෝ රක්ෂණ තැරැව්කරු වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ලබාගන්නා පුද්ගලයෙකු අදහස් වේ.

### සුදුසුකම්

- අවු 18ට වැඩි ලාංකික පුරවැසියෙකු විය යුතුය
- ගණිතය ඇතුළුව අ.පො.ස.(සා.පෙළ) සමත් විය යුතුය.
- ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය මඟින් පවත්වනු ලබන පූර්ව - අනුයුක්තතා විභාගයෙන් සමත් විය යුතුය.

## රක්ෂණ පැමිණිලි විභාග කිරීම

රක්ෂණ සමාගම්වලට එරෙහිව රක්ෂණ ඔප්පු හිමියන් විසින් කරනු ලබන රක්ෂණ හිමිකම් ගෙවීම් සම්බන්ධ ආරවුල් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා විසින් විභාග කරනු ලබයි.

කෙටි කලක් ඇතුලත කාර්යක්‍ෂමව රක්ෂණ ආරවුල් සමථයකට පත්කරන ඔම්බුඩ්ස්මන්වරයා ස්වාධීනව ක්‍රියාකරන්නෙකි.